# ලංසු ලියවිලි

## විවෘත තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය

## බස්නාහිර පළාත් සභා කාර්යය මණ්ඩලය සඳහා කාර්යාල ප්‍රවාහනය සේවා සැපයීම - 2025

**CSWP/ADM/24-120/FI/06**

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**පළාත් සභා ගොඩනැගිල්ල,**

**නො.204, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,**

**බත්තරමුල්ල.**

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

රිසිට් පත් අංකය:-.................................................................................................................

ගමනාන්තය:-.........................................................................................................................

සැපයුම්කරුගේ නම:-..............................................................................................................

බස් රථ අංකය:-.......................................................................................................................

# පටුන


1) ලංසු ආරාධනා පත්‍රය…………………………………………………………………(02,03)

2) උපදෙස් සහ කොන්දේසි පත්‍රිකාව……………………………………………………(04,05)

3) ලංසු තොරතුරු පත්‍රිකාව………………………………………………………(06,07,08)

4) ලංසු ආකෘතිය………………………………………………………………………(09)

5) මිල ගණන් ඉදිරිපත් කිරීමේ අයදුම්පත………………………………………………(10,11)

6) ඉදිරිපත් කරන ලංසුවේ අඩංගු වියයුතු ලියවිලි………………………………………(12)


පරීක්ෂා කිරීම සඳහා පමණි

## <u>බස්නාහිර පළාත් සභාව</u>

## <u>ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත.</u>

**බස්නාහිර පළාත් සභා කාර්යය මණ්ඩලය සඳහා කාර්යාල ප්‍රවාහන සේවා සැපයීම සඳහා බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි බස් රථ ධාවකයින්ගෙන් ලංසු කැඳවීම.**

**2025 වර්ෂය සඳහා**

බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි බස්නාහිර පළාත් සභා කාර්යාල ගොඩනැගිල්ල වෙත පහත සඳහන් මාර්ග ඔස්සේ රාජකාරි දිනවල උදේ සහ සවස කාර්යය මණ්ඩලය සඳහා කාර්යාල ප්‍රවාහන පහසුකම් සලසා ගැනීමට 2006 වර්ෂය හෝ ඊට පසු වර්ෂවල ලියාපදිංචි කළ වායු සමීකරණ රහිත බස් රථ සඳහා සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ.

| අංකය | බස් රථය | ගමන් මාර්ගය |
|---|---|---|
| 1) | බත්තරමුල්ල - දෙමටගොඩ | පළාත් සභා කාර්යාලය, කොස්වත්ත හංදිය, වල්පොල හංදිය, අයි.ඩී.එච්, කොලොන්නාව, දෙමටගොඩ දුම්රිය ස්ථානය. |
| 2) | බත්තරමුල්ල - කළුතර | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, අතුරුගිරිය අධිවේගී මාර්ගය හරහා, ගැලනිගම අධිවේගී මාර්ගය දක්වා, බණ්ඩාරගම, පානදුර, කළුතර |
| 3) | බත්තරමුල්ල - පාදුක්ක | පළාත් සභා කාර්යාලය, විදේශ සේවා බස් රථ නැවතුම, නව හමුදා මූලස්ථාන පාර, පැලවත්ත, තලවතුගොඩ,පන්නිපිටිය නව පාලම හරහා හයිලෙවල් පාර, කොට්ටාව, හෝමාගම, ගොඩගම, අලුත් පාර හරහා මීපේ සිට පාදුක්ක. |
| 4) | බත්තරමුල්ල - ගම්පහ | පළාත් සභා කාර්යාලය, මාලඹේ, කඩුවෙල, බියගම, දෙල්ගොඩ, වැලිවේරිය, බැලුම්මහර, මිරිස්වත්ත, ගම්පහ |
| 5) | බත්තරමුල්ල - බණ්ඩාරගම | පළාත් සභා කාර්යාලය, පාලම් තුන හරහා, කිඹුලාවල හංදිය, මහරගම, පිළියන්දල, මාකන්දන, කිදෙල්පිටිය, මැදගම, බණ්ඩාරගම. |
| 6) | බත්තරමුල්ල - හොරණ | පළාත් සභා කාර්යාලය, පැලවත්ත, තලවතුගොඩ, පන්නිපිටිය, කොට්ටාව, පොල්ගස්ඕවිට, කහතුඩුව, කෝරලඉම, කුඹුක, පොකුණුවිට, හොරණ. |
| 7) | බත්තරමුල්ල - කඩවත | පළාත් සභා කාර්යාලය, කොස්වත්ත හංදිය, වල්පොල හංදිය, අංගොඩ, කැළණිමුල්ල, නාගහමුල, මාකොළ, මාවරමංඩිය, කඩවත. |
| 8) | බත්තරමුල්ල - මොරටුව | පළාත් සභා කාර්යාලය, කොස්වත්ත හංදිය, බත්තරමුල්ල හංදිය, පාලම් තුන හංදිය, කිඹුලාවල හංදිය, ජුබිලි කණුව, ගම්සභා හංදිය, පැපිලියාන, අත්තිඩිය, බේකරිය හංදිය, ටෙම්ප්ලර් පාර හරහා ගල්කිස්ස, රත්මලාන, බොරුපන, මොරටුව. |

| | | |
|---|---|---|
| 9) | බත්තරමුල්ල - වේයන්ගොඩ | පළාත් සභා කාර්යාලය, මාලඹේ, කඩුවෙල, බියගම, දෙල්ගොඩ, වැලිවේරිය, මිරිස්වත්ත, කළගෙඩිහේන, නිට්ටඹුව, වේයන්ගොඩ. |
| 10) | බත්තරමුල්ල - අළුත්ගම | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, අතුරුගිරිය අධිවේගී මාර්ගය හරහා, ගැලනිගම අධිවේගී මාර්ගය දක්වා, බණ්ඩාරගම, මොරොන්තුඩුව, වාඩියමංකඩ, කළුතර, අළුත්ගම. |
| 11) | බත්තරමුල්ල - මීනුවන්ගොඩ | පළාත් සභා කාර්යාලය, කොස්වත්ත හංදිය, වල්පොල හංදිය, අංගොඩ, කැළණිමුල්ල, කිරිබත්ගොඩ, මහහාගේ, ඒකළ, මීනුවන්ගොඩ. |
| 12) | බත්තරමුල්ල - මතුගම | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, අතුරුගිරිය අධිවේගී මාර්ගය හරහා, දොඩංගොඩ, මතුගම. |
| 13) | බත්තරමුල්ල - කොස්ගම | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, කඩුවෙල, නවගමුව, හංවැල්ල, කොස්ගම. |
| 14) | බත්තරමුල්ල - මීගොඩ | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, අරංගල, අතුරුගිරිය, හබරකඩ, ගොඩගම, මීගොඩ. |

01) මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2024.11.08 දින සිට 2024.11.28 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව.2.45 දක්වා එක් අයදුම්පතක් සඳහා ආපසු නොගෙවනු ලබන රු.5,000.00 ක් සහ ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු ගාස්තු ලෙස රු.15,000.00ක්, බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204, ප්‍රධාන ලේකම් කාර්යාලයේ, 6 වන මහලේ පිහිටි මූල්‍ය අංශය වෙත ගෙවීමෙන් පසු ලබා ගන්නා රිසිට් පත, 4 වන මහලේ පිහිටි පාලන අංශයේ ප්‍රසම්පාදන ඒකකය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු අයදුම්පත් කට්ටලය ලබා ගත හැක. එසේම අයදුම්පතේ මුල් පිටපත සමග ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදල ගෙවනු ලැබූ ලදුපතේ පැහැදිලි ඡායා පිටපතක්ද අමුණා එවිය යුතුය.

02) මුද්‍රා තබන ලද ලංසු ලියවිලි මුල් පිටපත හා අනු පිටපත වශයෙන් පිටපත් දෙකකින් ඉදිරිපත් කල යුතු අතර එම ලංසු ලියවිලි 10”x5” ප්‍රමාණයේ ලියුම් කවරයක බහා 2024.11.29 දින ප.ව.1.00 ට පෙර ලැබෙනසේ සභාපති, සුළු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය, හතර වන මහල, අංක. 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් ගණකාධිකාරි (පාලන) නිල කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට (ටෙන්ඩර් පෙට්ටියට) බහාලීම කල යුතුය. ලංසු බහලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ **“මිල ගණන් - බස්නාහිර පළාත් සභා කාර්යය මණ්ඩලය සඳහා කාර්යාල ප්‍රවාහනය සේවා සැපයීම සඳහා ලංසු කැඳවීම - 2025”** යනුවෙන් සඳහන් කළ යුතුය.

සභාපති
සුළු ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාත.

**<u>ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා වලංගු කොන්දේසි හා උපදෙස් :</u>**

**<u>කොන්දේසි :</u>**

01. ලංසු ඉදිරිපත් කල හැක්කේ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ට පමණි. සේවාව ලබා ගැනීමට අපේක්ෂිත කාල සීමාව **2025.01.01** සිට **2025.12.31** දින දක්වා වේ.
02. ලංසු ඉදිරිපත් කරන පුද්ගලයා හෝ ආයතනය නමින් වාහනය ලියාපදිංචි කර තිබිය යුතුය. (ඒ බව සනාථ කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයේ පැහැදිලි ඡායා පිටපතක් සාමදාන විනිශ්චයකාරවරයකු හෝ බලයලත් නිලධාරියකු වෙතින් සහතික කරගෙන ඉදිරිපත් කල යුතුය.)
03. ඉල්ලුම් කරනු ලබන බස් රථ 2006.01.01 දින හෝ ඉන් පසු ලියාපදිංචි කරනු ලැබූ බස් රථ පමණක් විය යුතුය.
04. ලංසු තොරතුරු පත්‍රිකාවේ සඳහන් ආසන සංඛ්‍යාවට වඩා බස් රථයේ ආසන සංඛ්‍යාව අඩු නොවිය යුතුය. ඊට වඩා වැඩි ආසන සංඛ්‍යාවක් සහිත බස් රථ සඳහා **ප්‍රමුඛත්වය** දෙනු ඇත.
05. බස් රථයේ ගමන් ගන්නා මගීන්ගේ ජීවිත අවදානම ආරක්ෂණ සහතිකය මගින් සම්පූර්ණයෙන්ම ආවරණය විය යුතුය. (අසීමිත රක්ෂණ ආවරණයක් විය යුතුය.)
06. තෝරා ගන්නා ලද සාර්ථක ලංසුකරුවන් අදාල බස් රථයේ ආදායම් බලපත්‍රය, යෝග්‍යතා සහතිකය, අසීමිත රක්ෂණ සහතිකය, රියදුරුගේ රියදුරු බලපත්‍රය සහ වෛද්‍ය සහතිකය යන සහතික පත්‍රයන්හි මුල් පිටපත් ගිවිසුම් ගත වීමට ප්‍රථම ඉදිරිපත් කල යුතුය.
07. සාරානුකූලව ප්‍රතිචාර දක්වන අදාල ලංසුකරුහට කොන්ත්‍රාතුව පිරිනැමීමේ දී ගිවිසුම් ගතවීම ප්‍රතික්ෂේප කලහොත් රු 15,000.00 ක ආපසු ගෙවන ලංසු තැන්පතුව රජයට පවරා ගනු ලබන අතර වසර පහක් යන තෙක් මෙම කාර්යාල ප්‍රවාහන සේවාව සඳහා අයදුම් කල නොහැක.
08. සෑම මසකම පළමු සතිය තුල, පෙර මාසය උදෙසා බිල්පත, ධාවන වේලා සටහන් සමඟ ඉදිරිපත් කල දින සිට වැඩකරන දින 11කට (එකොලහ) පසුත්, වැඩකරන දින 15කට (පහලොව) පෙරත් ගෙවීම් කටයුතු සිදුකරනු ඇත.
09. සැපයුම්කරුගේ ක්‍රියා කලාප හේතුවෙන් පළාත් සභා පරිශ්‍රයේ යම් දේපලකට හානියක් සිදුවුවහොත් හා/ හෝ සේවාව අඛණ්ඩව පවත්වාගෙන නොයෑම හේතුවෙන් යම් පාඩුවක් හෝ හානියක් සිදුවුවහොත් එකී අලාභය ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ගෙවිය යුතුය. එසේ නොගෙවන අවස්ථාවකදී සැපයුම්කරු වෙත ගෙවීමට නියමිත දෛනික සේවා ගාස්තුවෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.
10. සැපයුම්කරු විසින් බස් රථය සඳහා ඉන්ධන ලබා දිය යුතුය.
11. වලංගු රියදුරු බලපත්‍රයක් සහිත මනා සෞඛ්‍ය තත්වයකින් යුත් විනයගරුක රියදුරෙකු සේවයේ යෙදවිය යුතුය. මගීන් ප්‍රවාහනය කරන බලපත්‍රයක් (P.T. License) ලබා තිබෙන රියදුරෙකු යෙදවීම වඩා යෝග්‍ය වේ. ඔහු අපරික්ෂාකාරි ධාවනයක යෙදීම, ආචාරශීලී නොවීම, සහ යම්කිසි විනය විරෝධී ක්‍රියාවක් සඳහා චෝදනා ඉදිරිපත් වේ නම්, ඒ සම්බන්ධයෙන් සොයා බලා රියදුරු ඉවත් කිරීමට ක්‍රියා කල යුතුය.
12. බස් රථයේ රියදුරු ඉවත් කර නව රියදුරකු සේවයේ යොදවන්නේ නම් ඒ පිළිබඳව පූර්ව අනුමැතිය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගෙන් ලබා ගත යුතුය.
13. බස් රථයේ සේවාවන් සහ ධාවනයට අත්‍යාවශ්‍ය නොවන නඩත්තු කටයුතු රාජකාරී වේලාවෙන් පරිබාහිරව සිදුකර ගත යුතුය.
14. හදිසි ආපදා අවස්ථාවකදී අනුමත බස් රථය සේවයේ යෙදවීමට නොහැකි විටදී සමාන පහසුකම් ඇති අවශ්‍ය ධාරිතාවයක් සහිත බස් රථයක් සේවයේ යෙදවිය යුතුය. කලින් හඳුනාගනු ලබන ආපදා තත්වයන් හේතුවෙන් බස් රථය සේවයේ යෙදවීමට නොහැකි අවස්ථාවලදී ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගෙන වෙනත් බස් රථයක් සේවයේ යෙදවීමට කටයුතු කල යුතුය. එසේ ධාවනය කරන විකල්ප බස් රථය, ධාවනය කල හැකි කාල සීමාව උපරිම දින 14 කට යටත්වේ.
15. බස්නාහිර පළාත් සභා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කරනු ලබන රාජකාරී දිනයන්හි මගීන් ප්‍රවාහනය සඳහා බස් රථය යොදා නොගත යුතුය.
16. ගමන් කරන කාර්යාල සේවකයින්ට අමතරව ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් අවසර නොදුන් කිසිදු මගියෙකු ඇතුලත් කර නොගත යුතුය.
17. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් හෝ ඔහුගේ නියෝජිතයකු දැනුම් දුන් අවස්ථාවේ යෝජිත බස් රථය පරීක්ෂා කිරීමට අවස්ථාව සලසා දිය යුතුය.
18. තෝරාගත් සැපයුම්කරුවන් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් සමඟ සේවා ගිවිසුමකට එළඹිය යුතුය. එම සැපයුම්කරුවන් අනුමත ගමන් මාර්ගයට පරිබාහිර ගමන් මාර්ගයක ගමන් නොකල යුතු වන අතර හදිසි තත්වයකදී ගමන්කරන්නේ නම් ඒ බව ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත දන්වා අනුමැතිය ලබා ගත යුතුය.

19. බස් රථයේ රියදුරු විසින් පෙ.ව. 8.15ට පෙර කාර්යාලය වෙත පැමිණීමට හා ප.ව.4.30 ට කාර්යාල පරිශ්‍රයෙන් පිටත් වීමට කටයුතු කල යුතු අතර පැමිණීමෙන් පසු සහ පිටත්වීමට පෙර ආරක්ෂක අංශයේ තබා ඇති ලේඛණය අත්සන් කල යුතුය.
20. ලංසු ලියවිලි ඇතුළත් සෑම පිටුවකම ලංසුකරු විසින් අත්සන් යොදා තිබිය යුතුය.
21. ඩීසල් මිල අඩු හෝ වැඩි වීමකදී ගෙවීම් කටයුතු පහත සමීකරණය මත රදා පවතියි. එහිදී ආසන 42ක සහ ඊට වැඩි බස් රථ සඳහා ඩීසල් ලීටරයකින් ධාවනය කල හැකි දුර කිලෝමීටර් තුනයි දශම පහක් (3.5) ලෙසද, ආසන 42ට අඩු බස්රථ සඳහා ඩීසල් ලීටරයකින් ධාවනය කල හැකි දුර කිලෝමීටර් හයක් (06) ලෙස සලකනු ලැබේ.

**දෛනික ගෙවීම අඩුවීම/වැඩිවීම = (වර්තමාන ඉන්ධන මිල - ලංසු කැඳවන ආරම්භක දිනයේ ඉන්ධන මිල) / ඩීසල් ලීටරයකින් ධාවනය කල හැකි දුර x දිනකදී ධාවනය කරනු ලබන දුර**

22. සෑම දිනකම ධාවනයට පෙර බස් රථය පිරිසිදු කල යුතු අතර එය ධාවනයට පත් කිරීමේ දී යෝග්‍ය තත්ත්වයෙන් පැවතිය යුතුය.
23. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් වරින්වර නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට අනුකූලව සේවා සැපයිය යුතුය.
24. ගිවිසුම් ගත කාලයට පෙර දෙපාර්ශවයෙන් කවර පාර්ශවයකට හෝ සේවාව අවසන් කිරීමට අවශ්‍ය වේ නම් ඒ බව ලිත් මාස දෙකකට පූර්වයෙන් අනිවාර්යයෙන්ම දැනුම් දිය යුතුය. බස් රථයේ ගමන් කරන මගීන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් මතු වුවහොත් පූර්ව දැනුම් දීමකින් පසු සේවා සැපයුම්කරුගේ සේවය අවසන් කිරීමේ බලය ප්‍රධාන ලේකම් සතුය.
25. තෝරාගත් සැපයුම්කරුවන් විසින් ඒ ඒ ගමන් මාර්ගයට අදාල මාසික ලංසු මුදලට සමාන ආරක්ෂණ ඇප තැන්පතුවක් ප්‍රධාන ලේකම් කාර්යාලයේ මූල්‍ය අංශය වෙත ගෙවීමෙන් පසු ලබා ගන්නා රිසිට් පත, 4 වන මහලේ පිහිටි පාලන අංශය වෙත ගිවිසුම් ගතවන අවස්ථාවේදී ඉදිරිපත් කල යුතුය.
26. තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් අයකල රු. 15,000.00ක ලංසු ආරක්ෂණ මුදල හා ගමන් මාර්ගයට අදාල මාසික ලංසු මුදලට සමාන ආරක්ෂණ ඇප තැන්පතුව අදාල ගිවිසුම් කාලය අවසන් වීමෙන් (2025.12.31න්) පසු ආපසු නිදහස් කරනු ලැබේ.
27. ගිවිසුම් ගත කාලයට පෙර යම් සැපයුම්කරුවෙකු ලිත් මාස දෙකකට පූර්වයෙන් තම සේවාව අවසන්කරන බව ලිඛිතන දැනුම් නොදී ගිවිසුමට පටහැනිව කටයුතු කර ප්‍රවාහන සේවාව අතරමැද නතර කලහොත් එම සැපයුම්කරුගෙන් ලබාගත් රු. 15,000.00ක ඇප තැන්පතුව හා තමා ප්‍රවාහන සේවාව සැපයූ ගමන් මාර්ගයට අදාල මාසික ලංසු මුදලට සමාන ආරක්ෂණ ඇප තැන්පතුව, රජයට පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ.
28. යම් සැපයුම්කරුවෙක් නොවැළැක්විය හැකි හේතුවක්/ හෝ හේතු මත යම් මාර්ගයකට අදාල තම ප්‍රවාහන සේවාව අඛණ්ඩව සැපයිය නොහැකිබව ලිත් මාස දෙකකට පූර්වයෙන් දැනුම් දුන් අවස්ථාවක, එකී මාර්ගයට අදාලව නැවන නව සැපයුම්කරුවෙකු තොරා ගැනීමෙන් අනතුරුව පෙරකී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල සැපයුම්කරුගෙන් ලබා ගෙන ප්‍රධාන ලේකම් කාර්යාලය භාරයේ රඳවා ගෙන තිබූ සියලු ආරක්ෂණ ඇපතැන්පතු මුදල් නැවත ඔහු වෙත නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.
29. යම් සැපයුම්කරුවෙකු ප්‍රවාහන සේවා සැපයීමෙන් ඉවත් වූ අවස්ථාවක එවැනි මාර්ගයක් වෙනුවෙන් බස්රථයක් තාවකාලිකව යෙදවීමට සිදුවන අතර එහිදී සේවා අවශ්‍යතාවය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අවස්ථානුකූලව ප්‍රාදේශීය වශයෙන් මිල ගණන් කැඳවා නව සැපයුම්කරුවෙකු තෝරා ගැනීමේ බලය ප්‍රසම්පාදන අස්ථිත්වය සතුය.
30. අයදුම්කරුවන් හට ඕනෑම ගමන් මාර්ගයක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කල හැකි අතර, එක් ලියාපදිංචි අංකයක් සහිත බස් රථයකින් එක් ගමන් මාර්ගයක් සඳහා පමණක් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.
31. සමාගමක් හෝ ලියාපදිංචි ව්‍යාපාරයක් විසින් අයදුම් කරන්නේ නම් ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සහතික කල පැහැදිලි ඡායාස්ථ පිටපතක් ඉදිරිපත් කල යුතුය.
32. මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසු ඉදිරිපත් කළ යුතු දිනට පූර්ව වසර 05ක කාල සීමාව තුල, බස්නාහිර පළාත් සභා කාර්යය මණ්ඩලය ප්‍රවාහන සේවාව සඳහා ඇති කර ගත් ගිවිසුමට අනුව ප්‍රවාහන සේවාව ලබා දී, ගිවිසුමට අදාල කාල සීමාව තුල සේවය අඛණ්ඩව පවත්වාගෙන යාමකින් තොරව ගිවිසුමෙන් ඉවත් වූ කිසිදු තැනැත්තෙකු මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසු ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබන්නේය.
33. ඉහතින් දක්වා ඇති කොන්දේසි වලට අනුකූල නොවී රාජකාරි සඳහා යොදවන බස් රථ සේවයෙන් ඉවත්කිරීමට කටයුතු කරනු ඇත.

<u>**උපදෙස්**</u>

01. ප්‍රවාහන පහසුකම් සැපයීමට යෝජිත බස් රථයට අමතරව කොපමණ බස් රථ ලංසු ඉදිරිපත් කරන්නා සතුද යන වගත් ඒ පිළිබඳව අවශ්‍ය තොරතුරු ලෙස; එකී බස්රථයේ වර්ගය, මාදිලිය හා ආසන සංඛ්‍යාව ආදී විස්තර නිවැරදිව ඉදිරිපත් කල යුතුය.
02. බස් රථයේ ධාවන සේවාවන් හා ටයර් මාරු කිරීම් රාජකාරී සඳහා බාධාවක් නොවන අයුරින් ඉටුකර ගත යුතුය.
03. ඉදිරිපත් කරන වාහනයේ කොපමණ මගීන් ප්‍රවාහනය කල හැකිදැයි සටහන් කල යුතුය.

**ලංසු තොරතුරු පත්‍රිකාව.**

ප්‍රසම්පාදන අංශය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
නො.204, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල,
04 වන මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

ලිපිගොනු අංකය - CSWP/ADM/24-120/FI/06

01. බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි බස්නාහිර පළාත් සභා කාර්යාල ගොඩනැගිල්ල වෙත පහත සඳහන් මාර්ග ඔස්සේ නියමිත ආසන සංඛ්‍යාව හෝ ඊට වැඩි ආසන සංඛ්‍යාවකින් යුත් බස් රථ සඳහා සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ.

| **අංකය** | **බස් රථය** | **ආසන සංඛ්‍යාව** | **ගමන් මාර්ගය** |
|---|---|---|---|
| 1) | බත්තරමුල්ල - දෙමටගොඩ | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය,කොස්වත්ත හංදිය, වල්පොල හංදිය, අයි.ඩී.එච්, කොලොන්නාව, දෙමටගොඩ දුම්රිය ස්ථානය. |
| 2) | බත්තරමුල්ල - කළුතර | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, අතුරුගිරිය අධිවේගී මාර්ගය හරහා, ගැලනිගම අධිවේගී මාර්ගය දක්වා, බණ්ඩාරගම, පානදුර, කළුතර. |
| 3) | බත්තරමුල්ල - පාදුක්ක | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, විදේශ සේවා බස් රථ නැවතුම, නව හමුදා මූලස්ථාන පාර, පැලවත්ත, තලවතුගොඩ, පන්නිපිටිය නව පාලම හරහා හයිලෙවල් පාර, කොට්ටාව, හෝමාගම, ගොඩගම, අලුත් පාර හරහා මීපේ සිට පාදුක්ක. |
| 4) | බත්තරමුල්ල - ගම්පහ | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, මාලඹේ, කඩුවෙල, බියගම, දෙල්ගොඩ, වැලිවේරිය, බැලුම්මහර, මිරිස්වත්ත, ගම්පහ. |
| 5) | බත්තරමුල්ල - බණ්ඩාරගම | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, පාලම් තුන හරහා, කිඹුලාවල හංදිය, මහරගම, පිළියන්දල, මාකන්දන, කිඳෙල්පිටිය, මැදගම, බණ්ඩාරගම. |
| 6) | බත්තරමුල්ල - හොරණ | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, පැලවත්ත, තලවතුගොඩ, පන්නිපිටිය, කොට්ටාව, පොල්ගස්ඕවිට, කහතුඩුව, කෝරලඉම, කුඹුක, පොකුණුවිට, හොරණ. |
| 7) | බත්තරමුල්ල - කඩවත | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, කොස්වත්ත හංදිය, වල්පොල හංදිය, අංගොඩ, කැළණිමුල්ල, නාගහමුල, මාකොළ, මාවරමංඩිය, කඩවත. |

| | | | |
|---|---|---|---|
| 8) | බත්තරමුල්ල - මොරටුව | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය,කොස්වත්ත හංදිය, බත්තරමුල්ල හංදිය,පාලම් තුන හංදිය, කිඹුලාවල හංදිය, ජුබිලි කණුව,ගම්සභා හංදිය, පැපිලියාන, අත්තිඩිය, බේකරිය හංදිය, ටෙම්ප්ලර් පාර හරහා ගල්කිස්ස, රත්මලාන, බොරුපන, මොරටුව. |
| 9) | බත්තරමුල්ල - වේයන්ගොඩ | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, මාලඹේ, කඩුවෙල, බියගම, දෙල්ගොඩ, වැලිවේරිය, මිරිස්වත්ත, කළගෙඩිහේන, නිට්ටඹුව, වේයන්ගොඩ. |
| 10) | බත්තරමුල්ල - අළුත්ගම | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, අතුරුගිරිය අධිවේගී මාර්ගය හරහා, ගැලනිගම අධිවේගී මාර්ගය දක්වා, බණ්ඩාරගම, මොරොන්තුඩුව, වාඩියමංකඩ, කළුතර, අළුත්ගම. |
| 11) | බත්තරමුල්ල - මිනුවන්ගොඩ | 44 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, කොස්වත්ත හංදිය, වල්පොල හංදිය, අංගොඩ, කැළණිමුල්ල කිරිබත්ගොඩ, මහහාගේ, ඒකළ, මිනුවන්ගොඩ. |
| 12) | බත්තරමුල්ල - මතුගම | 40 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, අතුරුගිරිය අධිවේගී මාර්ගය හරහා, දොඩංගොඩ. මතුගම. |
| 13) | බත්තරමුල්ල - කොස්ගම | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, කඩුවෙල, නවගමුව, හංවැල්ල, කොස්ගම, අවිස්සාවේල්ල. |
| 14) | බත්තරමුල්ල - මීගොඩ | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, අරංගල, අතුරුගිරිය, හබරකඩ, ගොඩගම, මීගොඩ. |

02. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටියට අනුව සිදු කරනු ලැබේ.

03. ලංසු භාර ගැනීම අවසන් කරන දින සිට දින 91 කාලයක් දක්වා ලංසු වලංගු විය යුතුය.

04. ලංසු ලියකියවිලි ඇතුළත් සෑම පිටුවකම ලංසුකරු විසින් අත්සන් යොදා තිබිය යුතුය. සමාගමක් නම් නිල මුද්‍රාව තබා අත්සන් කල යුතුය.

05. බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, අංක 204, දරන ස්ථානයේ, ප්‍රධාන ලේකම් කාර්යාලය (පාලන) අංශයට අයත් ප්‍රසම්පාදන ඒකකය තුළදී කිසිදු ගෙවීමකින් තොරව කාර්යාල වේලාව තුළදී ලේඛණ පරීක්ෂා කළ හැක.

06. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2024.11.08 දින සිට 2024.11.28 දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව.2.45 දක්වා එක් අයදුම්පතක් සඳහා ආපසු නොගෙවනු ලබන රු.5,000.00 ක් සහ ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු ගාස්තු ලෙස රු.15,000.00ක්, බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, අංක 204, ප්‍රධාන ලේකම් කාර්යාලයේ, 6 වන මහලේ පිහිටි මූල්‍ය අංශය වෙත ගෙවීමෙන් පසු ලබා ගන්නා රිසිට් පත, 4 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන ඒකකය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු අයදුම්පත් කට්ටලය ලබා ගත හැක. එසේම අයදුම්පතේ මුල් පිටපත සමග ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදල ගෙවනු ලැබූ ලදුපතේ පැහැදිලි ඡායා පිටපතක්ද අමුණා එවිය යුතුය.

07. මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කල යුතුය. මුල් පිටපත සහ අනු පිටපත යන්න ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ සටහන් කර, වෙන වෙනම ලියුම් කවර දෙකක බහා, එම ලියුම් කවර දෙක, 10”×5” ප්‍රමාණයේ ලියුම් කවරයක බහා, 2024.11.29 දින ප.ව.1.00ට පෙර ලැබෙනසේ සභාපති, සුළු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.), හතරවන මහල (04), අංක 204, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගණකාධිකාරී (පාලන) නිල කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම කල යුතුය. ලංසු බහලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ “**මිල ගණන් -**

**බස්නාහිර පළාත් සභා කාර්යය මණ්ඩලය සඳහා කාර්යාල ප්‍රවාහනය සේවා සැපයීම සඳහා ලංසු කැඳවීම - 2025**" යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම එකී ලංසු 2024.11.29 දින ප.ව. 1.00ට විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගී විය හැක.

08. තෝරා ගත් සැපයුම්කරු ප්‍රධාන ලේකම් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.
09. ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබා දී ඇති කාලය දීර්ඝ කිරීම සඳහා කිසිදු අයුරකින් සලකනු නොලබන අතර තැපැලේදී ඇතිවන ප්‍රමාදවීම් සඳහා ප්‍රසම්පාදන ඒකකය, ප්‍රධාන ලේකම් කාර්යාලය වග කියනු නොලැබේ.
10. මෙහි සඳහන් උපදෙස් වලට අනුකූලතාවය නොදක්වන ඕනෑම ලංසුවක් ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
11. මෙම ප්‍රසම්පාදනය ඕනෑම අවස්ථාවක දී අවලංගු කිරීමේ බලය ප්‍රසම්පාදන කමිටුව සතුය.
12. වැඩිදුර විස්තර සඳහා කාර්යාල වේලාව තුළදී දුරකථන අංක 011-2093249 මඟින් ප්‍රධාන ලේකම් කාර්යාලයේ, ගණකාධිකාරි (පාලන) ඇමතිය හැකිය.

සභාපති
සුළු ප්‍රසම්පාදන කමිටුව
ප්‍රධාන ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාත,

පරීක්ෂා කිරීම සඳහා පමණි.

## ලංසු ආකෘතිය (Form of Bid)

සභාපති,
සුළු ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාත.

(සටහන: ලංසු ආකෘතිය නිකුත් කිරීමට ප්‍රථම, (*) සලකුණ දක්වා ඇති සියළුම හිස්තැන් සේවායයා විසින් නියමිත පරිදි පිරවිය යුතුය.)
කොන්ත්‍රාත්තුවේ නම: බස්නාහිර පළාත් සභා කාර්ය මණ්ඩලය සඳහා කාර්යාල ප්‍රවාහන සේවා සැපයීම.

ප්‍රධාන ලේකම් (බ.ප.) වෙතට,
(CSWP/ADM/24-120/FI/06)

මහත්මයාණෙනි,

1. පහත අත්සන් කරන මම/ අපි, ඉහත සඳහන් කාර්යය ඉටුකිරීම සඳහා සියලු කොන්දේසි, උපදෙස් හා ලංසු තොරතුරු පත්‍රිකාව පරික්ෂා කිරීමෙන් අනතුරුව, එම කාර්ය ඉහත සඳහන් කොන්ත්‍රාත් කොන්දේසි, සංශෝධන අනුව ශ්‍රී ලංකා මුදලින් *රු. ........................................................................................................................ (VAT රහිත) (රු. ............................... කට) (VAT රහිත) හෝ ඉහත කී කොන්දේසි වලට අනුකූලව තීරණය කරනු ලබන වෙනත් මුදලකට ඉටු කිරීමට පොරොන්දු වන්නෙමි./ වන්නෙමු.
2. මගේ/ අපගේ ලංසුව පිළිගතහොත් 2025.01.01 සිට කාර්ය ආරම්භ කිරීමටත්, 2025.12.31 දින දක්වා කාල සීමාව තුළ කොන්ත්‍රාත්තුවට අදාල මුළු සේවා සැපයීමටත් මම/ අපි පොරොන්දු වෙමි./ වෙමු.
3. ලංසු තොරතුරු පත්‍රිකාවෙහි 3 වගන්තියේ සඳහන් කාල සීමාව තුල මෙම ලංසු වෙනුවෙන් මම/අපි බැඳී සිටීමට එකඟ වන අතර, එම කාල සීමාව ඉකුත් වීමට පෙර ඕනෑම අවස්ථාවක මෙම කොන්ත්‍රාතුව භාර ගැනීමට පොරොන්දු වෙමි./වෙමු.
4. විධිමත් ගිවිසුම පිළියල කොට ඊට එළඹෙන තෙක් මෙම ලංසුව සහ ඔබගේ ලිඛිත පිරිනැමීමේ ලිපිය මඟින් ඔබ හා අප අතර නෛතික බැඳීමක් ස්ථාපිත කෙරෙන බව මම/අපි පිළිගනිමි./ පිළිගනිමු.
5. අවම ලංසුව පිළිගැනීමට හෝ ඔබ වෙත ලැබෙන ඕනෑම ලංසුවක් පිළිගැනීමට හෝ ඔබ බැඳී නොසිටින බව මම/අපි දනිමි./දනිමු.
6. *..........................................................................................වෙනුවෙන් ලංසුව අත්සන් කිරීමට *..........................................................................................................වශයෙන් යථා පරිදි බලයලත් වර්ෂ 2025 ක්වූ...........................මස...............................දිනදී ය.

නම : ..........................................................................................................................................

අත්සන: ..........................................................................................................................................

ලිපිනය: ..........................................................................................................................................

අත්සනට සාක්ෂි:

| | නම | අත්සන |
|---|---|---|
| 01 | ........................................................ | ............................................................ |
| 02 | ........................................................ | ............................................................ |

**බස්නාහිර පළාත් සභා කාර්ය මණ්ඩලය, කාර්යාල ප්‍රවාහනය සඳහා ලංසු කැඳවීම.**

**2025 වර්ෂය සඳහා අයදුම් පත්‍රය.**

**වාහනයේ ලියාපදිංචි අයිතිකරු පිළිබඳ තොරතුරු :-**

**ගමන් මාර්ගය:** බත්තරමුල්ල -................

| | | |
|---|---|---|
| 01 | ප්‍රවාහන පහසුකම් සපයන ආයතනයේ / පුද්ගලයාගේ නම | |
| 02 | ලිපිනය | |
| 03 | හැඳුනුම්පත් අංකය | |
| 04 | ග්‍රාම නිලධාරී වසම | |
| 05 | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | |
| 06 | දිස්ත්‍රික්කය | |
| 07 | දුරකථන අංකය | |
| 08 | විද්‍යුත් තැපෑල | |
| 09 | ෆැක්ස් | |

(**පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය ඇමිණිය යුතුය.)

**වාහනය පිළිබඳ තොරතුරු :-**

| | | |
|---|---|---|
| **10** | වාහනයේ වර්ගය | |
| **11** | වාහනයේ මාදිලිය | |
| **12** | වාහනයේ ආසන සංඛ්‍යාව (රියදුරු අසුන හැර) | |
| **13** | වාහන අංකය | |
| **14** | නිෂ්පාදන වර්ෂය | |
| **15** | ලියාපදිංචි වර්ෂය | |

සම්මා සද්දා ක්‍රිම සම්මා සම්බු.

**ගමන් මාර්ගය සහ ඉදිරිපත් කරන ලද මිල ගණන් පිළිබඳ තොරතුරු :-**

| | | | |
|---|---|---|---|
| 16 | මාර්ග විස්තරය | | |
| 17 | වැට් අංකය (තිබේ නම්) | | |
| 18 | දෛනික ගාස්තුව - ඉලක්කමෙන් (අධිවේගී මාර්ග පිවිසුම් ගාස්තු සහිතව) VAT බදු රහිත | | |
| 19 | දෛනික ගාස්තුව - අකුරින් (අධිවේගී මාර්ග පිවිසුම් ගාස්තු සහිතව) VAT බදු රහිත | | |
| 20 | දෛනික ගාස්තුව - ඉලක්කමෙන් (අධිවේගී මාර්ග පිවිසුම් ගාස්තු සහිතව) VAT බදු සහිත | | |
| 21 | දෛනික ගාස්තුව - අකුරින් (අධිවේගී මාර්ග පිවිසුම් ගාස්තු සහිතව) VAT බදු සහිත | | |
| 22 | අයදුම්කරුට අයත් වෙනත් බස් රථ | ලියාපදිංචි වර්ෂය | |
| | | ආසන ගණන | |
| | | වාහන මාදිලිය | |
| | | වර්ගය | |
| 23 | අයදුම්පත්‍ර ගාස්තු ගෙවූ ලදුපත් අංකය (පිටපත් ඇමිණිය යුතුය.) | | |
| 24 | ඇප තැන්පතු ගාස්තු ගෙවූ ලදුපත් අංකය (පිටපත් ඇමිණිය යුතුය.) | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරැදි බව මා ප්‍රකාශ කරමි. මෙම සේවාව සඳහා මා තෝරා ගනු ලබන්නේ නම් අදාල කොන්දේසි හා නියමයන්ට යටත්ව සේවාව විධිමත්ව පවත්වාගෙන යාමට එකඟ වන බව මෙයින් ප්‍රකාශ කරමි.

.................................... ..........................................................

දිනය අයදුම්කරුගේ අත්සන

## වෙනත් කරුණු (සැලකිය යුතුයි.)

**ඉදිරිපත් කරන ලංසුවේ අඩංගු විය යුතු ලේඛන. (Check List)**

| විස්තරය | | පිටු අංකය | ඉදිරිපත් කර ඇත / නැත |
|---|---|---|---|
| 1) | නිසි අයුරින් පුරවා අත්සන් කරන ලද ලංසු ආකෘතිය (Form of Bid) | (09) | |
| 2) | මිල ගණන් යෙදූ ඉල්ලුම් පත්‍රය. | (10/11) | |
| 3) | අනු අත්සන් යෙදූ උපදෙස් සහ කොන්දේසි පත්‍රිකාව | (04/05) | |
| 4) | අනු අත්සන් යෙදූ ලංසු තොරතුරු පත්‍රිකාව | (06/07/08) | |
| 5) | බස් රථය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කල සහතිකයේ සහතික කරන ලද පැහැදිලි ඡායා පිටපතක්. | ඡායා පිටපතක් ඇමිණිය යුතුය. | |
| 6) | ග්‍රාම නිලධාරී සහතිකය | ඇමිණිය යුතුය. | |
| 7) | වැට් (VAT) සඳහා ලියාපදිංචි වී ඇත්නම් ලියාපදිංචි සහතිකයේ පැහැදිලි පිටපතක්. | ඡායා පිටපතක් ඇමිණිය යුතුය. | |
| 8) | අයදුම්පත්‍ර සහ ඇප තැන්පතු ගාස්තු ගෙවූ ලදුපතෙහි පිටපතක් | ඡායා පිටපතක් ඇමිණිය යුතුය. | |
| 9) | ව්‍යාපාර නාම ලියා පදිංචි සහතිකයේ සහතික කල පැහැදිලි ඡායාපිටපතක් | ඡායා පිටපතක් ඇමිණිය යුතුය. | |
| 10) | රක්ෂණ සහතිකයේ පැහැදිලි පිටපතක් | ඡායා පිටපතක් ඇමිණිය යුතුය. | |
| 11) | ආදායම් බලපත්‍රයේ පැහැදිලි පිටපතක් | ඡායා පිටපතක් ඇමිණිය යුතුය. | |

- මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කල යුතුය. මුල් පිටපත සහ අනු පිටපත යන්න ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කර, වෙන වෙනම ලියුම් කවර දෙකක බහා, එම ලියුම් කවර දෙක, 10”×5” ප්‍රමාණයේ ලියුම් කවරයක බහා, 2024.11.29 දින ප.ව.1.00 ට පෙර ලැබෙනසේ සභාපති, සුළු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය, 4 වන මහල, අංක. 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගණකාධිකාරී (පාලන) නිල කාමරයේ තබා ඇති ලංසු පෙට්ටිය (ටෙන්ඩර් පෙට්ටිය) ට අතින් ගෙනවිත් බහාලීම කල යුතුය. ලංසු බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ **“මිල ගණන් - බස්නාහිර පළාත් සභා කාර්යය මණ්ඩලය සඳහා කාර්යාල ප්‍රවාහනය සේවා සැපයීම සඳහා ලංසු කැඳවීම. - 2025”** යනුවෙන් සඳහන් කළ යුතුය.

# ප්‍රසම්පාදන දැන්වීමයි

## ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත

## බස්නාහිර පළාත් සභා කාර්යය මණ්ඩලය සඳහා කාර්යාල ප්‍රවාහන සේවා සැපයීම - 2025 සඳහා ලංසු කැඳවීම.

බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, බස්නාහිර පළාත් සභා කාර්යාල සංකීර්ණයේ සේවයේ නියුතු කාර්යය මණ්ඩලය සඳහා 2025 වර්ෂය තුළ කාර්යාල ප්‍රවාහන සේවා සැපයීමට සුදුසු සේවා සැපයුම්කරුවන් තෝරා ගැනීම පිණිස බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් වෙතින් ලංසු කැඳවීම් කරනු ලැබේ.

2024.11.08 දින සිට 2024.11.28 දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව.2.45 දක්වා එක් අයදුම්පතක් සඳහා ආපසු නොගෙවනු ලබන රු.5,000.00 සහ ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු ගාස්තු ලෙස රු.15,000.00ක්, බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204, ප්‍රධාන ලේකම් කාර්යාලයේ, 6 වන මහලේ පිහිටි මූල්‍ය අංශය වෙත ගෙවීමෙන් පසු ලබා ගන්නා රිසිට් පත, 4 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන ඒකකය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු අයදුම්පත් කට්ටලය ලබා ගත හැක. මෙම කාලය තුල ප්‍රධාන ලේකම් කාර්යාලයේ පාලන අංශයේදී හෝ ප්‍රධාන ලේකම් කාර්යාලයේ adm.chiefsec.wp.gov.lk වෙබ් පිටුව මඟින් ලංසු ලේඛන පරික්ෂා කිරීම සිදු කල හැක.

ලංසු ඉදිරිපත් කිරීම සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් නිකුත් කර ඇති ලංසු ලියවිලි පමණක් භාවිතා කල යුතු අතර එම ලියවිලි වල සඳහන් උපදෙස් වලට අනුව, නිසි පරිදි සකස් කරන ලංසු, 2024.11.29 දින ප.ව.1.00 ට පෙර ලැබෙනසේ සභාපති, සුළු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය, 4වන මහල, අංක.204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගණකාධිකාරී (පාලන) නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම කල යුතුය. ලංසු බහලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මිල ගණන් - බස්නාහිර පළාත් සභා කාර්යය මණ්ඩලය සඳහා කාර්යාල ප්‍රවාහන සේවා සැපයීම - 2025 සඳහා ලංසු කැඳවීම" යනුවෙන් සඳහන් කල යුතුය.

මේ පිළිබඳව වැඩිදුර විස්තර 011-2093249 මඟින් ගණකාධිකාරී (පාලන) අමතා ලබාගත හැක.

සභාපති,

සුළු ප්‍රසම්පාදන කමිටුව,

බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය,

අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,

බත්තරමුල්ල.

2024.11.07